2024.09.

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

11 ශ්‍රේණිය

විභාග අංකය :................................ කාලය : පැය 01

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

නම : ..........................................................................................

01. සන්නිවේදනය වර්ගීකරණය කිරීමේ හොඳම පදනම වනුයේ,
(i) භාෂාව අනුව (ii) ස්ත්‍රී පුරුෂ සංඛ්‍යාව අනුව
(iii) මාධ්‍ය අනුව (iv) සහභාගී වන පුද්ගල සංඛ්‍යාව අනුව

02. පරිකල්පනයට වඩාත් වැදගත් මාධ්‍ය වනුයේ,
(i) පුවත්පත (ii) රූපවාහිනිය
(iii) ගුවන් විදුලිය (iv) අන්තර්ජාලය

03. ''අපට සන්නිවේදනයෙන් තොරව සිටිය නොහැක'' මෙම ප්‍රකාශය තුළින් අදහස් කරනුයේ,
(i) පුද්ගලාන්තර සන්නිවේදනය පිළිබඳවය.
(ii) නිර්වාචික සන්නිවේදනය පිළිබඳවය.
(iii) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදය පිළිබඳවය.
(iv) සමූහ සන්නිවේදනය පිළිබඳවය.

Learning Resource Centre
De Mazenod College
Kandana

04. ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පත
(i) ලංකාලෝකය (ii) සරසවි සඳරැස
(iii) ඥානාර්ථ ප්‍රදීපය (iv) ලක්මිණි පහන

05. කළුලෑල්ල මත සටහන් කල තොරතුරක් සම්පූර්ණයෙන් මකා දමා නොතිබූ හෙයින්, අලුතින් ලියූ සටහනක රූප සටහනක අපැහැදිලි බවකින් යුක්ත විය. මෙය,
(i) අර්ථ බාධාවකි. (ii) තාක්ෂණික බාධාවකි.
(iii) දෘශ්‍ය බාධාවකි. (iv) මාධ්‍ය බාධාවකි.

06. ඒකකාච ප්‍රතිඡායා කැමරාවක් භාවිතා කර රූපගත කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙළ පිළිවෙලින්,
(i) නාභිගත කිරීම, අණාවරණය, මානනය (ii) අණාවරණය, මානනය, නාභිගත කිරීම
(iii) මානනය, නාභිගත කිරීම, අණාවරණය (iv) මානනය, නාභිගත කිරීම, අණාවරණය

07. පුවත්පතක් සැලසුම් කිරීමේදී මුලින්ම ඉඩ වෙන්කරනු ලබන්නේ,
(i) ප්‍රවෘත්ති සඳහා (ii) වෙළඳ දැන්වීම් සඳහා
(iii) රජයේ නිවේදන සඳහා (iv) ශීර්ෂ පාඨ සඳහා

08. අන්තර්පුද්ගල සන්නිවේදනයේ විශේෂත්වය වන්නේ
(i) කුඩා පුද්ගල පිරිසක් සම්බන්ධ වීමයි.
(ii) ජනමාධ්‍ය භාවිතයට ගනී.
(iii) පුද්ගලයා තුළම පවතින සන්නිවේදනයකි.
(iv) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය වේගවත් වීමයි.

09. අලුතින් ආරම්භ කරන ලද ග්‍රාමීය නිමි ඇඳුම් අලෙවි ආයතනයකට තම පාරිභෝගිකයින් වැඩිකර ගැනීමට කළමනාකාරීත්වය අපේක්ෂා කරයි. ඒ සඳහා වඩාත් සුදුසුම ප්‍රචාරණ උපක්‍රමය වන්නේ,
(i) ගුවන් විදුලිය හා පුවත්පත් දැන්වීම් (ii) පෝස්ටර් හා අත්පත්‍රිකා
(iii) රූපවාහිනී හා ගුවන්විදුලි දැන්වීම (iv) අත් පත්‍රිකා හා පුවත් පත දැන්වීම

10. අවිධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය ප්‍රධාන වශයෙන් ස්වරූප තුනකින් යුක්ත වේ. ඊට අයත් නොවන ස්වරූපය වන්නේ,
(i) තනි දාමය (ii) පර්ෂද දාමය
(iii) හරස් දාමය (iv) සම්භාවිතා දාමය

11. භාෂාවේ රූප දෙකක් පෙනෙන නිසා වාචික හා ලිඛිත ලෙස භාෂාව පැවතිම දැකගත හැකිය. එය හඳුන්වන්නේ,
(i) භාෂා පරිකල්පනය (ii) භාෂා ස්වරූපය
(iii) භාෂා ද්විරූපතාවය (iv) භාෂා නිපුණතාවය

12. අදහස් ලිවීම සඳහා කඩදාසි සොයා ගැනීම ලිඛිත සන්නිවේදනයේ සුවිශේෂී අවස්ථාවකි. ඒ සඳහා මුල් වූයේ,
(i) ජපන් ජාතිකයන් (ii) රුසියානු ජාතිකයන්
(iii) චීන ජාතිකයන් (iv) ජර්මන් ජාතිකයන්

13. මුද්‍රිත කාර්යයේද අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණක් නම්,
(i) ඡායාරූප භාවිතා කිරීම
(ii) මාධ්‍යයේ ගුණාත්මක භාවය
(iii) ආකර්ෂණීය ලෙස නිමා කිරීම
(iv) භාෂා භාවිතයේදී වැඩි අවධානයක් යොමු කිරීම

14. ඡායාරූප ශිල්පීන් ඡායාරූප භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුත්තේ,
(i) කැමරාකෝණය වෙතටයි. (ii) ඡායාරූපයේ අඳුර හා එළිය වෙතටයි.
(iii) පාරිසරික සාධක වෙතටයි. (iv) කැමරාවේ වර්ණය වෙතටයි.

15. රෝගියෙකු සිටින නිවසක කඩුල්ල ළඟ කොහොඹ අතු කිහිපයක් එල්ලා තිබුණි. මෙය,
(i) දෘෂ්‍ය සන්නිවේදනය (ii) අවාචික සන්නිවේදනය
(iii) ශ්‍රව්‍ය සන්නිවේදනය (iv) සමූහ සන්නිවේදනය

16. සියලු තොරතුරු අප වෙත ලබා නොදීම සහ අන්‍යයන්ට ලැබෙන සියලු තොරතුරු අපට ලබා නොදීමෙන් සැලකෙන්නේ,
(i) දොරටුපාල සංකල්පය (ii) සන්නිවේදන බාධක ලෙසය
(iii) සන්නිවේදක කාර්යයක් ලෙසය (iv) සංජානනය ලෙසය

17. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා බලපාන භාෂා කුසලතාවයක් නොවන්නේ,
(i) අර්ථ ගැන්වීම (ii) යෝග්‍යතාවය
(iii) පාරිසරික සාධක (iv) උච්චාරණය

18. ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණයක් නොවන්නේ,
(i) කාන්දම් ලෑල්ල (ii) අන්තර්ක්‍රියාකාරී පුවරුව
(iii) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය (iv) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය

19. ලේඛනයක පිටපතක් ලබා ගැනීම සඳහා යොදාගනු ලබන්නේ,
(i) ඩොට් මුද්‍රණ යන්ත්‍රය (ii) ඡායා පිටපත් යන්ත්‍රය
(iii) ලේසර් මුද්‍රණ යන්ත්‍රය (iv) ඩිජිටල් අනු පිටපත් කරන යන්ත්‍රය

20. ''බ්‍රෝඩ්ෂීට්'' පුවත්පතක ලක්ෂණයක් වන්නේ,
(i) පළල් පිටුවලින් හරි අඩක පුවත්පත්ය.
(ii) ආකර්ෂණීය ආකෘතිවලින් යුක්ත වේ.
(iii) ජාතික හා අන්තර් ජාතික තේමාවලින් යුක්තය.
(iv) ත්‍රාසජනක විශේෂාංග ඇතුළත් වේ.

21. ආධුනික ඡායාරූප ශිල්පියෙකුට සාමාන්‍ය දළ සේයාපට කැමරාවලට වඩා ඩිජිටල් කැමරාව වැදගත් වන්නේ එමඟින් ඡායාරූප,
(i) විශාල පිරිසකට යැවීමට හැකියාව ඇති බැවිනි.
(ii) පහසුවෙන් තැන්පත් කරගත හැකි බැවිනි.
(iii) විශාල කර මුද්‍රණය කළ හැකි බැවිනි.
(iv) ක්ෂණිකව හැරඹිය හැකි බැවිනි.

22. ''ගුවන් විදුලිය යනු ග්‍රාහක කේන්ද්‍රිය මාධ්‍යයකි.'' මින් අදහස් වනුයේ,
(i) ගුවන් විදුලි වැඩසටහන්වල ග්‍රාහක දායකත්වය වැඩි බවය.
(ii) ග්‍රාහක මනාපය මත තෝරාගත හැකි බවය.
(iii) ග්‍රාහකයා ඉලක්ක කර ගත් වැඩසටහන් ඉදිරිපත් කරන බවය.
(iv) ග්‍රාහක ඉල්ලීම්වලට ඉහළ තැනක් ලබාදෙන බවය.

23. රූපවාහිනී මාධ්‍යයේදී ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමේදී නිශ්චිත අදහසක් ප්‍රේක්ෂකයාගේ මනසට ලබාදීමට නිවේදකයා උත්සාහ කරයි. ඒ සඳහා වඩාත් යෝග්‍ය රූප රාමුව වනුයේ,
(i) අතිශය සමීප රූපයකි. (ii) අතිශය දුර රූපයකි.
(iii) මධ්‍යම රූපයකි. (iv) දුර රූපයකි.

24. යටිකුරු පිරමීඩ ආකෘතිය
(i) ප්‍රවෘත්ති වාර්තාකරණය හා සම්බන්ධ වූවකි.
(ii) මාධ්‍ය ආයතනික ව්‍යුහය හා සම්බන්ධ වූවකි.
(iii) ජන සන්නිවේදනය හා සම්බන්ධ වූවකි.
(iv) සමූහ සන්නිවේදනය හා සම්බන්ධ වූවකි.

25. ''කොළඹ - මහනුවර බසය නියමිත වේලාවට බස්නැවතුම්පළින් පිටත්වීම ප්‍රවෘත්තියක් නොවේ.'' මෙම ප්‍රකාශයෙන් අදහස් කරනුයේ,
(i) ප්‍රවෘත්තියක් බොහෝවිට අහම්බයෙන් සිදුවන්නක් බවයි.
(ii) සෑම සිද්ධියක්ම ප්‍රවෘත්තියක් වීමට ඇත්තේ අඩු ඉඩකඩක් පවතින බවයි.
(iii) වැදගත් සිදුවීම් හඳුනාගැනීමට ''පුවත් ඉව'' වැදගත් වන බවයි.
(iv) ප්‍රවෘත්තිමය සිදුවීම් ඕනෑම තැනක සිදුවිය හැකි බවයි.



REGISTRAR
De Mazenod College
Kandana.

26. දිනපතා පුවත් පතක පළවූ ප්‍රවෘත්ති කිහිපයක් පහත දැක්වේ.
- රාජ්‍ය සේවකයන්ගේ ජීවන වියදම ඉහළ නංවයි.
- ඇසළ පෙරහැර හෙට වීදි සංචාරය කරයි.
- ක්‍රිකට් ක්‍රීඩකයෙකු ක්‍රීඩාවෙන් සමුගනී.
- බස් - ලොරි අනතුරකින් 6 දෙනෙකු මරුට

ඉහත ප්‍රවෘත්ති අනුපිළිවෙලින් දෘඪ (Hard) හා මෘදු (Soft) පුවත් ලෙස නිවැරදිව වර්ගකර ඇති පිළිතුර තෝරන්න.

(i) දෘඪ, මෘදු, මෘදු, දෘඪ (ii) දෘඪ, මෘදු, දෘඪ, මෘදු

(iii) මෘදු, මෘදු, දෘඪ, දෘඪ (iv) මෘදු, දෘඪ, මෘදු, දෘඪ

27. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භ වන්නේ,

(i) පෘතුගීසි පාලන සමයේදී ය. (ii) ලන්දේසි පාලන සමයේ දී ය.

(iii) ඉංග්‍රීසි පාලන සමයේ දී ය. (iv) පශ්චාත් යටත් විජිත පාලන සමයේ දී ය.

28. මෙම රූප සටහන් වලට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,




(i) දෘශ්‍ය, අවාචික සංකේත වේ.

(ii) දේශීය මහාමාර්ග නීති හා දෘශ්‍ය සංකේත වේ.

(iii) ජාත්‍යන්තර අවාචික, දෘශ්‍ය සන්නිවේදනයට අයත් වේ.

(iv) වාචික, දෘශ්‍ය, ජාත්‍යන්තර සංඥා වේ.

29. මෘදුකාංග (software) යන්නෙන් අදහස් වන්නේ,

(i) පරිගණකයක් සිදු කල යුතු සෑම කාර්යයක්ම පැහැදිලි කර දෙනු ලබයි.

(ii) පරිගණකයේ මොළය හැඳින්වෙන කොටසකි.

(iii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන උපකරණයකි.

(iv) පරිගණකයට පිටතින් සම්බන්ධ කළ හැකි උපකරණයකි.

30.
- තත්පර කිහිපයකදී ඕනෑම තැනක සිට පණිවිඩ යැවිය හැකිය.
- යවන පණිවිඩය අමතරව ඡායාරූප, ගීත, වීඩියෝ ආදිය ද යැවිය හැකිය.
- ලැබෙන පණිවිඩ අනුපිළිවෙලින් ගබඩා කල හැකිය.
- අනවශ්‍ය පණිවිඩ විවෘත නොකරම ඉවත් කල හැකිය.

ඉහත ප්‍රකාශන සියල්ලම ගැලපෙන සන්නිවේදන ක්‍රියාවලිය වන්නේ,

(i) Fax පණිවිඩ සේවාව (ii) කෙටි පණිවිඩ (SMS) සේවාව

(iii) අන්තර්ජාල සේවාව (iv) විද්‍යුත් තැපැල් සේවාව

31. තොරතුරු දැන ගැනීමේ පුද්ගල අවශ්‍යතාවයක් නොවන්නේ,

(i) ආහාර, ඇඳුම්, නිවාස වැනි මූලික අවශ්‍යතා සපුරා ගැනීමට

(ii) එදිනෙදා ජීවිතයේ කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමට

(iii) විවිධ ජන කොටස්වල සංස්කෘතික වටිනාකම් පවත්වාගෙන යාම

(iv) සමාජය සමඟ අන්තර් සම්බන්ධතා පවත්වාගෙන යාමට

2024 09

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

11 ශ්‍රේණිය

විභාග අංකය :.................................... කාලය : පැය 02

සැලකිය යුතුයි.

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර අනෙකුත් සියලුම ප්‍රශ්න වලට ලකුණු 10 බැගින් හිමිවේ.

### II පත්‍රය

01. මහානාම විද්‍යාලයේ සාහිත්‍ය කමිටුව විසින් මෙම වර්ෂයේ සිදු කිරීමට බලාපොරොත්තුවන කලා උළෙල පිළිබඳ සාකච්ඡා කලහ. එහිදී එහි සාමාජික සාමාජිකාවෝ විසින් සිදු කල යුතු කාර්යයන් රැසක් පිළිබඳ යෝජනා අදහස් ඉදිරිපත් කරති. අයෙක් තර්ක කරති. තවකෙක් ඊට හරස් කපති. සමහරෙක් ඒවා අනුමත කර, එය කල යුතු ආකාරය දක්වති. ඒ අතරතුර තවත් අය වෙනත් කතාබහක යෙදී සිටිති.

    (i) ඉහත සාකච්ඡාව අයත්වන සන්නිවේදන වර්ගය කෙටියෙන් අර්ථ දක්වන්න. (ල.2)

    (ii) ඉහත සාකච්ඡාව අයත්වන සන්නිවේදන වර්ගයෙහි ලක්ෂණ 2ක් ලියන්න. (ල2.)

    (iii) පාසලේ සාහිත්‍ය උළෙල සඳහා විද්‍යුත් මාධ්‍ය මෙන්ම මුද්‍රිත මාධ්‍යයන් කැඳවීමට සාකච්ඡා විය. එම මාධ්‍යයන් දෙකකට උදාහරණයන් වෙන වෙනම සඳහන් කරන්න. (ල.2)

    (iv) මෙම උළෙලේ අවස්ථාවන් දැක්වෙන ඡායාරූප මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පළකල යුතු බවට යෝජනා විය. මුද්‍රිත මාධ්‍ය තුළ ඡායාරූප භාවිතා කිරීමේදී ග්‍රාහකයාට ලැබෙන ප්‍රයෝජන 2ක් ලියන්න. (ල.2)

    (v) පාසලේ මාධ්‍ය ඒකකයේ සිටින ළමුන් විසින් මෙම අවස්ථාව ඡායාරූපගතකරණය සඳහා ඩිජිටල් කැමරාව (අංකිත කැමරාව) භාවිතා කිරීමට අපේක්ෂා කරයි. එහි ඇති වාසි දෙකක් ලියන්න. (ල.2)

    (vi) කලා උළෙල පිළිබඳ පිටරට සිටින ආදි ශිෂ්‍යයන් කරන්නේ නම්, ඒ සඳහා භාවිතා කළ හැකි නව මාධ්‍ය ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ල.2)

    (vii) ශ්‍රව්‍ය මාධ්‍යයේදී හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයේදී ග්‍රාහකයන් හඳුන්වන පද දෙක වෙන වෙනම ලියා දක්වන්න. (ල.2)

    (viii) කලා උළෙල පිළිබඳ ළමා පුවත්පතකට ලිපියක් ලිවීමට අදහස් කරයි. ලිඛිත භාෂාවේ හඳුනා ගත හැකි ලක්ෂණ (අංග) දෙකක් ලියන්න. (ල.2)

    (ix) මෙම උළෙලට සහභාගී වීමට ආරාධනා කරමින් ආරාධිත අමුත්තන්ට ලිපියක් යවන්නේ නම් ඒ සඳහා භාවිතා කළ හැකි අවම පිරිවැයකින් යුත් විද්‍යුත් පිටපත් කිරීමේ ක්‍රමයක් ලියන්න.(ල.2)

    (x) මාධ්‍යවේදීන් ප්‍රධාන වශයෙන් ප්‍රභේද කරන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල.2)

    (ල. 20)

02. "කෙනෙකුගේ සිතෙහි ඇතිවන අදහස්, සිතුවිලි, හැඟීම් අන්‍යයන් සමඟ හුවමාරු කර ගැනීම සන්නිවේදනයයි."

    (i) සන්නිවේදනයේ මූලිකාංග හතරක් නම කරන්න. (ල.1)

    (ii) ද්වි මාර්ගික සන්නිවේදන සූත්‍රය රූපසටහන් ඇසුරෙන් කෙටියෙන් හඳුන්වන්න. (ල.2)

    (iii) සන්නිවේදනයේදී ඇතිවිය හැකි ප්‍රධාන බාධක වර්ග දෙකක් කෙටියෙන් හඳුන්වා ඊට උදාහරණ සපයන්න. (ල.3)

    (iv) වාචික භාෂා ව්‍යවහාරයට වඩා ලිඛිත භාෂා ව්‍යවහාරය විධිමත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ල.4)

    (ල.10)



Learning Resource Centre
R
De Mazenod College
Kandy

03. ''රටේ හෝ ලෝකයේ සිදුවන සිදුවීමක් වාර්තා කිරීමට තරම් වැදගත්කමක් ඇති අවධානයට ලක්වන සමාජය තුළ එය දැන ගැනීමට උනන්දුවක් ඇතිවන තොරතුරක් ප්‍රවෘත්තියක් වේ.''

(i) ප්‍රවෘත්තියක් යන්න නිර්වචනයකින් හඳුන්වා දෙන්න. (ල.1)

(ii) අපට තොරතුරු ලබා ගැනීමට පාදක කර ගත හැකි තොරතුරු මූලාශ්‍ර දෙකක් පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්න. (ල.2)

(iii) නිර්මාණාත්මක රචනයේදී යටිකුරු පිරමීඩ ආකෘතිය භාවිතා කරන අයුරු රූපසටහන් ඇසුරින් පැහැදිලි කර දෙන්න. (ල.3)

(iv) යුනෙස්කෝ සන්නිවේදන විශේෂඥ පොල් ඩී. මැසෙනියර් (Paul de Maeseneer) විසින් ප්‍රවෘත්තියක විශ්වාසනීයත්වය පිළිබඳ සමීකරණයක් ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳ කෙටියෙන් විස්තරයක් කරන්න. (ල.4)

(ල.10)

04. ''වර්තමානයේ පරිගණකය යනු බහුමාධ්‍ය සන්නිවේදන උපකරණයකි.''

(i) පරිගණකය මගින් ඉටුකරගත හැකි කාර්යය දෙකක් සඳහන් කරන්න. (ල.1)

(ii) පන්ති කාමරයේ දී භාවිතා කළ හැකි ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණ 2ක් හා ප්‍රක්ෂේපණීය නොවන මාධ්‍ය උපකරණ 2ක් නම් කරන්න. (ල.2)

(iii) විද්‍යුත් තැපෑලෙහි ඇති ප්‍රයෝජන තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.3)

(iv) කළුලෑල්ල භාවිතා කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

(ල.10)

05. ''ඕනෑම සන්නිවේදන ක්‍රියාවලියක ආරම්භය වන්නේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි.''

(i) ඉහත ප්‍රකාශයට බලපාන ප්‍රධාන කරුණු දෙකක් නම් කරන්න. (ල.1)

(ii) අන්තර්පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගත හැකි තාක්ෂණික මෙවලම් හතරක් නම් කරන්න. (ල.2)

(iii) අභිසාරී මාධ්‍ය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.3)

(iv) දුරකථනය මගින් සම්බන්ධවන දෙපාර්ශවයන් විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම 4ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

(ල.10)

06. ''ජනමාධ්‍ය ආයතන නිසැකව ම ව්‍යාපාර බවට පත්ව ඇත. ආයතනයේ නඩත්තුවට හා නිෂ්පාදන වියදම් අධික වීම නිසා එම ආයතන නූතනයේ වෙළඳ දැන්වීම් මත රඳා පවතී.''

(i) ජන මාධ්‍යයේ හිමිකම අනුව ප්‍රධාන ආකාර දෙක නම් කරන්න. (ල.1)

(ii) වෙළඳ දැන්වීම් මගින් සමාජයට ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න. (ල.2)

(iii) ගුවන්විදුලිය සඳහා පිටපතක් සම්පාදනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.3)

(iv) පුරවැසියා යනු කවරෙක් දැයි හඳුන්වා පුරවැසිභාවයේ ලක්ෂණ 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.4)

(ල.10)

07. ''ජනමාධ්‍ය මගින් ලබාදෙන සෑම සන්දේශයකම නියෝජනය පවතිනුයේ සැඟවුණු ස්වභාවයකිනි. එය අනාවරණය කර ගත හැකි වන්නේ ග්‍රාහකයා එම සංදේශය අර්ථ ගන්වන ආකාරය අනුවය.''

(i) ජන මාධ්‍ය මගින් ප්‍රකාශනය වන සෞන්දර්යාත්මක වැඩසටහන් නැරඹීමෙන් පුද්ගලයාට ඇති ප්‍රයෝජන 2ක් ලියන්න. (ල.1)

(ii) ජනමාධ්‍ය හා රූපවාහිනී මාධ්‍යයේ නිශ්චල ඡායාරූප භාවිතයේ අවශ්‍යතා දෙකක් ලියන්න. (ල.2)

(iii) ගුවන් විදුලි වැඩසටහන් වර්ග 3ක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.3)

(iv) මාධ්‍ය ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ සිදු කරන ලද සමීක්ෂණයන් සඳහා දත්ත රැස්කළ හැකි ක්‍රම 4ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

(ල.10)



REGISTRAR
De Mazenod College
Kandana.